අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
THE OFFICE ON MISSING PERSONS

# ඇබෑර්තු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මඟින් ස්ථාපිත කරන ලද කාර්යාලකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## රැකවරණ ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Head of Protection

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රාදේශීය කාර්යාලවල රැකවරණ ඒකකය පවත්වාගෙන යාම අධීක්ෂණය හා සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආශ්‍රිතව විධිමත් රැකවරණ ක්‍රමවේදයන් සහ අනුගමනය කළයුතු පිළිවෙත් ඇතුලත්ව, වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීම පිළිබඳ වගකීම දැරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය / සාමය සහ ගැටුම් නිරාකරණය / දේශපාලන විද්‍යාව / සමාජ විද්‍යාව යන කේෂ්ත්‍රවල ප්‍රථම උපාධියක් සමග අදාල කේෂ්ත්‍රයේ / මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමණාකරන මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

**වයස :** අවු. 35 ට නොඅඩු විය යුතු අතර අවු. 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** Rs. 80,295 – 15 x 2,270 – 114,345/-

මෙම තනතුරට වාහන දීමනාවක්,ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

## වින්දිත හා පවුල් සහය ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Head of Victim and Family Support

**රැකියාවේ ස්වභාවය :** වින්දිත සහ පවුල් සහය ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ අදාල උපායමාර්ගික චාරිත්‍ර විධි සකස්කිරීම හා විශේෂඥයන් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් සකස්කොට සංවර්ධනය කිරීමද ඇතුලත්ව OMP ආයතනයෙහි මනෝසමාජයීය සහය සහ ප්‍රජා සේවා ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ගික සැලසුම් හා සමාලෝචන කටයුතු වල නායකත්වය දැරීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව / උපදේශනය හා මනෝවිද්‍යාව / දර්ශනය හා මනෝවිද්‍යාව/ සමාජ විද්‍යාව / සාමය හා ගැටුම් නිරාකරණය යන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** Rs. 80,295 – 15 x 2,270 – 114,345/-

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

## සෙවීමේ ඒකක ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Head of Tracing

**රැකියාවේ ස්වභාවය :** සෝදිසි කිරීම්, අධිකරණ වෛද්‍ය විමර්ශන ඊට අදාළ දත්ත කළමනාකරණ කටයුතු සඳහා තාක්ෂණ සහය ලබාදීමද ඇතුලත්ව සෙවීමේ හා විමර්ශන ඒකකය සැලසුම් කොට ස්ථාපිත කිරීම පිළිබඳ වගකීම දැරීම සහ අදාළ අන්තර් ඒකකයන් සමග සමීප සහයෝගිතාවක් පවත්වාගෙනයාම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය/ අපරාධ විද්‍යාව/ සමාජ විද්‍යාව ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ/ මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** Rs. 80,295 – 15 x 2,270 – 114,345/-

මෙම තනතුරට වාහන දීමනාවක්,ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

## මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Human Resources and Head of Administration

**රැකියාවේ ස්වභාවය :** ආයතනයේ පරිපාලනමය කටයුතු, මානව සම්පත් හා පරිපාලන අංශය අධීක්ෂණය කිරීම මෙන්ම මානව සම්පත් හා පරිපාලන ප්‍රතිපත්ති, පද්ධති හා ක්‍රියාපටිපාටි සකසමින් සියලුම පරිපාලන හා මානව සම්පත් කටයුතු ඉටුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමණාකරය/ රාජ්‍ය කළමණාකරනය/ රාජ්‍ය පරිපාලනය/ කළමණාකරනය යන කේෂ්ත්‍රයක ප්‍රථම උපාධියක් සමග අදාළ කේෂ්ත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ තනතුරෙහි විෂය කේෂ්ත්‍රයට අදාල පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජිකත්වය සමඟ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** Rs. 80,295 – 15 x 2,270 – 114,345/-

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

## මණ්ඩල ලේකම්/ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී (තනතුරු 01) MM 1-1

## Secretary to the Board / Senior Legal Officer

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස කටයුතු කිරීම සහ එම වගකීම් දැරීම සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කටයුතු වල නිරත වී සිටින තැනැත්තන්ගේ මනෝ සමාජයීය අවශ්‍යතාවයන් සඳහා උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට සහය ලබාදීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ උපාධියක් සහ දිවුරුම් දුන් නීතිඥවරයෙකු වීම සහ ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු.53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575/-

## ජ්‍යෙෂ්ඨ මනෝ සමාජයීය නිලධාරී (තනතුරු 01) MM 1-1

## Senior Psychosocial Officer

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කටයුතු වල නිරත වී සිටින තැනැත්තන්ගේ මනෝ සමාජයීය අවශ්‍යතාවයන් සඳහා උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයට අවශ්‍ය සහය ලබාදීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මනෝ විද්‍යාව / උපදේශනය හා මනෝ විද්‍යාව/ සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් සහ ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු.53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575/-

## ජ්‍යෙෂ්ඨ රැකවරණ නිලධාරී (තනතුරු 02) MM 1-1

## Senior Protection Officer

**රැකියාවේ ස්වභාවය :** වින්දිතයන්, සාක්ෂිකරුවන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාල ආරක්ෂා කිරීමේ ක්‍රම සහ ක්‍රියා පිළිවෙත් සැලසුම් කිරීම ඇතුළු ඒකකයේ වැඩ කටයුතු ඉටු කිරීම සඳහා ඒකක ප්‍රධානියාට සහය වීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මානව අයිතිවාසිකම්/ නීතිය/ සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ උපදේශනය පිළිබඳ උපාධියක් සහ ඉන් අනතුරුව තනතුරට අදාල කේෂ්ත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : Rs. 53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575/-

## ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂක (තනතුරු 01) MM 1-1

## Senior Data Analyst

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි දත්ත කළමනාකරණ ඒකකයෙහි සංඛ්‍යාලේඛන පවත්වාගෙනයාම සහ එම අංශයෙහි කාර්යක්ෂමතාවය නගා සිටුවන්නට අදාල දත්ත රැස් කිරීමේ ක්‍රම, දත්ත විශ්ලේෂණය හා අනෙකුත් උපායමාර්ග සංවර්ධනය කර පවත්වාගෙන යාම.

**සුදුසුකම් :** 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ ගණිතය/ සංඛ්‍යානය පිළිබඳ උපාධියක් සහ ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද,

හෝ

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 7) වැනි මට්ටමට නොඅඩු තොරතුරු තාක්ෂණයට අදාල ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමඟ ඉන් අනතුරුව අදාළ ක්ෂේත්‍රයෙහි රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද.

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු.53,175 – 10 X 755 – 15 X 1,910 - 95,575/-

## ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී (තනතුරු 02) MM 1-1

## Senior Investigation Officer

**රැකියාවේ ස්වභාවය :** සෙවීම් හා විමර්ශන ඒකකය ( Tracing and Investigation ) විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් වන අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සඳහා වූ විමර්ශන, පරීක්ෂණ සහ ඊට අදාල අනෙකුත් කටයුතු වලට සහය වීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීතිය/ ඉතිහාසය/ දේශපාලන විද්‍යාව/ මානව විද්‍යාව/ අපරාධ විද්‍යාව පිළිබඳ උපාධියක් සහ ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද.

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු.53,175 – 10 X 1375 – 15 X 1,910 - 95,575/-

## අභ්‍යන්තර විගණක නිලධාරී (තනතුරු 01) MM 1-1

## Internal Auditor

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි සහ එහි ප්‍රාදේශීය කාර්යාල වල මූල්‍ය ලේඛන පරීක්ෂා කිරීම සහ එහි කාර්යයන් පිළිගත් කාර්ය පටිපාටීන්ට අනුකූලව සිදුවන්නේ ද යන්න සොයා බලා ඒ පිළිබඳව වාර්තා කිරීම සහ මූල්‍ය කළමනාකරණ විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වා දීම හා පවත්වාගෙන යාම.

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ගිණුම්කරණය/ මූල්‍ය/ වාණිජ්‍යය පිළිබඳ මූලික උපාධියක් සහ ඉන් අනතුරුව තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද.

**හෝ**

2. පිළිගත් වෘත්තීය / වරලත් ආයතනයක (CIMA/ ACCA/ ICA) අන්තර්මධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම හෝ CMA සම්පූර්ණ සුදුසුකම් සපුරා තිබීම සහ ඉන් අනතුරුව තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද

**හෝ**

3. ගණකාධිකරණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) සහ ඉන් අනතුරුව තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු.53,175 – 10 X 1375 – 15 X 1,910 - 95,575/-

**සටහන :** රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් සේවයේ නියුතු ඉහත සුදුසුකම් සහිත නිලධාරීන් ද්විතීයනය පදනම මත අනුයුක්ත කිරීමද සලකා බලනු ඇත.

## නීති නිලධාරි (තනතුරු 04) JM 1-1

## Legal Officer

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සඳහා අවශ්‍ය නෛතික, ප්‍රතිපත්තිමය හා පර්යේෂණමය මැදිහත්වීම් සඳහා උපාය මාර්ග සැකසීම සඳහා නායකත්වය හා මාර්ගෝපදේශ ලබා දීම සඳහා නීති, ප්‍රතිපත්ති හා පර්යේෂණ අංශ ප්‍රධානීට සහාය වීම සහ එකී කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ උපාධියක් සහ දිවුරුම් දුන් නීතිඥවරයෙකු වීම.

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය..

**වැටුප් පරිමාණය :** රු. 42,600 – 10 x 755 – 18 x 1,135 – 70,580/-

## පර්යේෂණ නිලධාරී (තනතුරු 02) JM 1-1

## Research Officer

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ පර්යේෂණ ඒකකයෙහි අදාල කාර්යයන් සඳහා සහය වීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව ක්ෂේත්‍රයක උපාධියක්

**වයස :** අවු. 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 42,600 – 10 x 755 – 18 x 1,135 – 70,580/-

**සටහන :** රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් සේවයේ නියුතු ඉහත සුදුසුකම් සහිත නිලධාරීන් ද්විතියනය පදනම මත අනුයුක්ත කිරීමද සලකා බලනු ඇත.

## විමර්ශන නිලධාරී (තනතුරු 05) JM 1-1

## Investigation Officer

**රැකියාවේ ස්වභාවය :** විමර්ශන, පරීක්ෂණ සහ අතුරුදහන් වූ තැනැත්තන් සහ සොයා ගැනීමට නොහැකි වූ තැනැත්තන් පිළිබඳ කටයුතු වලදී අදාළ ඒකකයේ වැඩකටයුතු වලට සහාය ලබා දීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීතිය/ ඉතිහාසය/ දේශපාලන විද්‍යාව/ මානව විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක්

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය..

**වැටුප් පරිමාණය :** රු. 42,600 – 10 x 755 – 18 x 1,135 – 70,580/-

## වින්දිත හා පවුල් සහාය නිලධාරී (තනතුරු 06) JM 1-1

## Victim and Family Support Officer

**රැකියාවේ ස්වභාවය :** ස්ත්‍රී/ පුරුෂභාවයට සංවේදී වූ පරිසරයක් ශක්තිමත් කිරීම හා පවත්වා ගැනීම ද ඇතුළත්ව, අතුරුදහන් වූ හා සොයා ගැනීමට නොහැකි තැනැත්තන්ගේ පවුල් වෙනුවෙන් OMP කාර්යාලය විසින් ලබා දෙනු ලබන සියලුම සහාය හා සේවා ආශ්‍රිතව වින්දිතයන් කේන්ද්‍ර කොටගත් ප්‍රවේශයන් සහතික කරනු පිණිස වන වින්දිත හා පවුල් සහාය ඒකකයේ කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මානව හිමිකම්/ මනෝ විද්‍යාව/ උපදේශනය හා මනෝ විද්‍යාව/ සමාජ විද්‍යාව කේෂ්ත්‍රයක උපාධියක්.

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 42,600 – 10 x 755 – 18 x 1,135 – 70,580/-

## සභාපති/විධායක අධ්‍යක්ෂ පුද්ගලික සහායක (තනතුරු 01) MA 1-1

## Personal Assistant to Chairperson/ Executive Director

**රැකියාවේ ස්වභාවය :** සියලුම ලේකම්කරණ කාර්යයන් ඉටුකරමින් සභාපති / විධායක අධ්‍යක්ෂ වෙත අවශ්‍ය කාර්යාලීය සහය ලබාදීම.

**සුදුසුකම්** : (අ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ

(I) සිංහල / දෙමළ (II) ඉංග්‍රීසි භාෂාව (III) ගණිතය යන විෂයයන් 4 සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6කින් එක් වරකදි සමත් වීම.

**සහ**

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ ) විභාගයේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) අනෙකුත් විෂයන් 03 සමත් වීම.

මානව සම්පත් කළමනාකරණ/ ලේකම් පරිචය /පරිපාලන අධ්‍යයනය ක්ෂේත්‍රයක ඩිප්ලෝමාවක් සතු වීම, අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 27910 - 10X300 - 7X350 - 4X495 - 20X660 - 48540/-

**සටහන** : රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් සේවයේ නියුතු ඉහත සුදුසුකම් සහිත නිලධාරීන් ද්විතීයනය පදනම මත අනුයුක්ත කිරීමද සලකා බලනු ඇත.

**ඉහත සියලුම තනතුරු සඳහා අදාළ වන කරුණු :**

- සෑම අයදුම්කරුවෙක්ම,
  - ✓ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
  - ✓ යහපත් කායික හා මානසික තත්වයෙන් යුක්ත විය යුතුය
  - ✓ දිවයිනෙහි ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකිවිය යුතුය
  - ✓ යහපත් චරිතයකින් හෙබි විය යුතුය
- පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.
- අප විසින් සපයා ඇති අයදුම්පත සම්පූර්ණ කල යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු වූවකු නම් අදාල ආයතන හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
- අයදුම්කරුවන් විසින් එවනු ලබන අයදුම්පත් අතරින් තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී ලබාගන්නා ඉහල ලකුණු මත තෝරා ගනු ලැබේ.
- මෙම තනතුරු ස්ථිරවන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය හිමිවේ.
- අයදුම්පත්, අදාල සහතිකවල පිටපත් සමඟ 2023 අගෝස්තු 20 දිනට පෙර විධායක අධ්‍යක්ෂ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.



**නීතිඥ මහේෂ් කටුලන්ද**
**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**